# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.13 පැය 0835 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out 724 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මිනුවන්ගොඩ කඳවුර.**

2025.04.12 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මිනුවන්ගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ වල්පොල ප්‍රදේශයේදී වැටලීමක් **සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 46 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට** ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 46ත් අතර වයස්වල පසුවන රාගම හා හගුරන්කෙත ප්‍රදේශවල පදිංචිකරුවන්වේ.**

රාගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබන අතර වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමග යොමු කරමි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2025.04.12 වන දින උදෑසන කාලයේ හොරණ පොලිස් වසමේ පෝරුවදණ්ඩ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 18 මිලි ලීටර් 750 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමග යොමු කරමි.

**03. තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2025.04.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ සොලමන් වීදිය ප්‍රදේශයේදී වැටලීමක් **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 140 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යාපනය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**